**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2026**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි තනතුරු පුරප්පාඩු 50 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2026/04/06 වේ.**

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර පත්වීම් සහිත නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ එක් වර්ෂයක කාලයක් සඳහා පමණි.

01. විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්) රාජකාරි විස්තර :

නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු කඩිනම් කිරීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ කටයුතු සහ පරීක්ෂණ වාර්තා පිළියෙල කිරීමට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සහය වීමේ කාර්යයන්.

02. දීමනා :

මාසික දීමනාව - රු. 74,438/- හා ජීවන වියදම් දීමනාව රු.17,800/- ක් වේ.

03. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතුය.

04. (I) අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින් රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

(II). කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

05. වෙනත්:

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයක් මගින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

i. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පරීක්ෂා කරන අතර, ලකුණු ලබාදෙනු නොලැබේ.
ii. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු. අංක | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br><br>(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයකින් - රසායන විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>• පළමු පෙළ සාමාර්ථයක් සහිතව 10<br>• දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව 8<br>• දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිතව 5<br><br>(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයකින් - රසායන විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරන ලද විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br><br>• පළමු පෙළ සාමාර්ථයක් සහිතව 8<br>• දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව 5<br>• දෙවන පෙළ පහළ සාමාර්ථය 3<br><br>ඉහත I හා II සුදුසුකම් වලින් එකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>(ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 10 කි)<br><br>(III) ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයකින් ලබාගත් - රසායන විද්‍යාව පිළිබඳ<br>• පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 15<br>• පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 10<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ. උපරිම ලකුණු 15) | **25** | |

| අනු. අංක | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 02. | **ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද**<br><br>I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයක හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයක ශිල්ප ප්‍රදර්ශක (Demonstrator) ලෙස පළපුරුද්ද.<br>• වසරකට 10<br>• මාස 06 ට වැඩි 08<br>• මාස 03ට වැඩි 05<br>• මාස 03ට අඩු - ලකුණු ලබා නොදේ.<br><br>(I ට අදාළව ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 30 ක් වේ)<br><br>II. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීම.<br>• වසරකට 20<br>• මාස 06 කට වැඩි 15<br>• මාස 03 කට වැඩි 12<br>• මාස 03 ට අඩු 06<br><br>(II ට අදාළව ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 20 ක් වේ)<br><br>III. රජයේ හෝ පෞද්ගලික ආයතනවල රසායනාගාර විද්‍යාගාරවල පර්යේෂණ නිලධාරි, රසායනාගාර සහකාර ලෙස<br>• වසරකට ලකුණු 10<br>• මාස 06කට වැඩි ලකුණු 08<br>• මාස 03 ට වැඩි ලකුණු 05<br>• මාස 03ට අඩු ලකුණු ලබා නොදේ<br><br>(III ට අදාළව ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 10 ක් වේ)<br><br>ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීමේදී සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>සේවා කාලය සනාථ කිරීම සඳහා විධිමත් සේවා සහතික ඉදිරිපත් කළ යුතුය. | **60** | |
| 03. | පර්යේෂණ නිබන්ධන<br><br>I. දේශීය විදේශීය වශයෙන් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතුවල නිරත වී පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර තිබීම.<br><br>( එක් නිබන්ධනයකට ලකුණු 05 බැගින් පර්යේෂණ නිබන්ධන/ වාර්තා 02 ක් සඳහා පමණක් ලකුණු ලබා දේ. උපාධිය හෝ පශ්චාත් උපාධියට අදාළව සිදු කළ පර්යේෂණ නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ) | 10 | |

| අනු. අංක | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 04. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>i. සන්නිවේදන හැකියාව<br>ii. පෞරුෂත්වය | **05** | |
| | **එකතුව** | **100** | |

iii. ඉහත සඳහන් සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත එම සහතික වල මුල් පිටපත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

iv. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් සහ මූලික සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්) තනතුරේ සේවය කරමින් සිටින කිසියම් අවස්ථාවකදී හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ වෙනත් කිසියම් අවස්ථාවකදී හෝ අපේක්ෂකයා විසින් /ඔහු වෙනුවෙන් ලබා දී ඇති/ සපයා ඇති තොරතුරු නිවැරදි සහ බල සහිත ඒවා නොවේ යැයි හෙළි වුවහොත් කිසිදු පූර්ව දැනුම්දීමකින් හා වන්දි ගෙවීමකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි සේවය ලබා ගැනීම අවසන් කරනු ලැබේ.

ii. විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්) ලෙස තෝරා ගන්නා අයෙකුට එම තෝරා ගැනීම මත ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් කිසිදු රජයේ ආයතනයක කිසිදු ස්ථිර තනතුරක් ලබා ගැනීමට විශේෂ හිමිකමක් නොමැත.

08. සේවා කොන්දේසි :

i. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2023/29 හා 2022/12/14 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ අදාළ වේ.

ii. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින් කලින් කලට පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසිවලටද යටත් වීමට එකඟ විය යුතු ය.

09. අයදුම්පත් ඉදිරිපත් කිරීම:

ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලිපිකවරයේ වම්පස උඩ කෙලවරේ **"විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්)"** යනුවෙන් සඳහන් කර "ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල" ලිපිනයට 2026/04/06 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත සහතික කිරීම:

අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතිඥවරයෙකු /ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතුය.

11. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

12. පුරප්පාඩු පිරවීමේ, නොපිරවීමේ හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

13. මෙම නිවේදනයේ සිංහල,දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂා පාඨයේ සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන,**
ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2026 මාර්තු 13 දින,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.